# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) 2011

## 2013 මැයි / අගෝස්තු

## මානවශාස්ත්‍ර පීඨය

## සිංහල - SINH E1015

## නාට්‍ය කලාව, නූතන කාව්‍ය හා ප්‍රබන්ධ කථා

**පළමුවන ප්‍රශ්නය ද, දෙවන සහ තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව 09 යි.** **කාලය පැය 3.00 යි.**

**නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.**

---

1 කොටස

1. පහත සඳහන් පද්‍ය රචනය රසාස්වාදය කරන්න.

ලීල් නැතු ව තිසරු ව තෙපල ත්තේ
මාල් ල නුඹගේ හිමි ද අස ත්තේ
වාල් තමාවක් ඇද්ද ඉති ත්තේ
වාල් විඳින දුක මෙ නුඹ විඳි ත්තේ

පැසී ඉසත් තිකටත් සොඬු ඇකි ලේ
ගැසී කුදත් යන ගමනත් බක ලේ
තිසී වේද වෙත ඉඳිනට මෙක ලේ
ගැසී ද බොල තිගෙ දෑසට පට ලේ

කු දේ ගැසී නැගිටින කල වෙවු ලා
ත දේ කැසිත් කැස කැසපට අකු ලා
සො දේ විඳින සැප විඳුමට මෙක ලා
ළ දේ තිසරු නොකරත් අප සිය ලා

බඩවක පිට වක සම් වැරටි ල්ලා
දෙපටට කුඳු ගැසි වකට කුඳු ල්ලා
ඉසකේ පුපුරැටි දත් කඩ තො ල්ලා
තිගෙ සැමි බමුණා කුණු කෙළ තො ල්ලා

පෙර කල් ජාතියෙ පැකුවා වැ ත්තේ
පර මල් පිදුවාදෝ පල දූ ත්තේ
නර මුල් ඇඟ ඇට කිඹුලකු වැ ත්තේ
හැම කල් මළ පසු දෝ සැප ව ත්තේ

ගැසී වකට කුදු ඉසකේ සුදු ර ළු
පැසී තිකට දත් බොල්ලෑ කෙළ තො ළු
වැසී තිබෙන ඇස් බියකරලන සු ළු
නැසී කුමට උගෙ ගෙයි එක්කො ළු

එකමග යන කල ඔබිනට ඇ ද්දෝ
ආනන කල උගෙ කට ගඳ නැ ද්දෝ
තී සැටි බමුණත් මේ රට නැ ද්දෝ
ගැට කෝණමෙකුට ඉඳ පල ඇ ද්දෝ

එබසට ලජ්ජාවෙන් ළඳ බැමි ණී
අබ සැට ලාහක් පුපුරන ලෙසි නී
විලි වැද ඉවසා රොස්කොට එයි නී
කළ ගෙඩි බිඳ ගොස් තම ගෙට වැදු ණී

වෙවු ලයි පුපුරයි දත් කයි රොස් කො ට
සූර යි කම්මුල් දෙක ඇද තරකො ට
තැවු ලයි ගිය ගිය තැන රට වට ම ට
අවු ලයි වෙන්නේ මෙතනින් යන්න ට

මූ ණ රවාගෙන ගොස් ගෙට වැදි ලා
පූ න නූල ඇද දමමින් බිඳ ලා
යානේ උන් බමුණා බිම පෙර ලා
බා න ලෙසට අල්ලාගෙන රැවු ලා

කන්සෙ ට පාරක් දෙමැයි කිය න්නී
මන් බොල තොට දර දිය ද අදි න්නී
කන්න ට පැන්නා මෙන් වැලහි න්නී
කන්කටුවට කරදර තෙපල න්නී

## 2 කොටස

2. මහනුවර යුගයේ ලියැවුණු පද්‍ය ජනකවි ලෙසින් හැඳින්වීම කෙතරම් දුරට යුක්ති යුක්ත දැයි සංගෘහීත සිංහල පද්‍ය සංග්‍රහය ආශ්‍රයෙන් විමසන්න.

3. 1970 වර්ෂයෙන් ඇරඹෙන කාල පරිච්ඡේදයෙහි නිර්මාණය වූ පද්‍ය රචනා මගින් කෙතෙක් දුරට කාලීන සමාජ යථාර්ථය නිරූපණය වන්නේ දැයි පරීක්ෂා කරන්න.

නැතහොත්

පහත සඳහන් කවීන් අතරින් එක් අයෙකුගේ පද්‍ය නිර්මාණ පිළිබඳ ඇගයීමක් කරන්න.

(අ) සිරි ගුනසිංහ
(ඉ) ගුණදාස අමරසේකර
(උ) මහගම සේකර
(එ) දයාසේන ගුණසිංහ

4. නාට්‍ය කලාව කතා කලාවෙන් වෙනස් වන ආකාරය නිදර්ශනාශ්‍රයෙන් විභාග කරන්න.

5. 'ශ්‍රී හර්ෂදේවයන්ගේ රත්නාවලිය කලාත්මක සන්දර්භයෙන් හෙබි නාට්‍යයක් සඳහා මනා නිදර්ශනයකි' විමර්ශනය කරන්න.

## 3 කොටස

6. නූතන සිංහල කෙටිකතාව සම්භාව්‍ය කතා කලාවේ ක්‍රමවිකාශයක් ලෙස හැඳින්වීමේ යුක්ති යුක්ත භාවය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

7. පහත සඳහන් කෙටිකථා රචකයන්ගෙන් එක් අයෙකුගේ නිර්මාණ පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(අ) මාර්ටින් වික්‍රමසිංහ
(ඉ) ඒ. වී. සුරවීර
(උ) සෝමරත්න බාලසූරිය
(එ) දයාසේන ගුණසිංහ

8. 'විරාගයෙන් ආරම්භ වන නිෂ්ක්‍රිය චරිත ඇතුළත් නවකතා මාලාවෙහි වැඩි වශයෙන් දැකිය හැක්කේ ව්‍යාජ අනුකාරක කෘතීන් ය' මේ විචාරක මතය කෙතෙක් දුරට යුක්තියුක්ත දැයි පිරික්සන්න.

9. තෘෂ්ණාහරණ නවකථාවේ උපයුක්ත කතා කලාව එහි යථාර්ථය කෙරෙහි කෙසේ බලපා ඇද්දැයි නිදර්ශනාත්මක ව පරීක්ෂා කරන්න.

(සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගිනි)